සැ.යු .- (i) 2016.09.02 වැනි දින පළ වූ අංක 1983 දරන ගැසට් පත්‍රයේ VI අ කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,984 - 2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 892 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 894 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |


සැ. යු. - වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජුනි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


891 – B 081096 —403 (2016/09)
A 1-

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ඉඹුල්පේ

### උග්ගල් අළුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2016

1 උග්ගල් අළුත්නුවර කතරගම දේවාලයේ ඇසළ උත්සවය 2016 ඔක්තෝබර් මස 12 වැනි දින ආරම්භ වී ඔක්තෝබර් මස 17 වැනි දින දිය කැපීමෙන් අවසන් වේ.

2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස හා බටහිර පෙදෙස වන, පිරිත් වත්ත, ගල්වත්ත, මාළුකාර වත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහගෙදර වත්ත, යන ප්‍රදේශ පෙරහැරට පැමිණෙන නැටුම් කණ්ඩායම් හා වන්දනාකරුවන් ලැගුම් ගන්නා ප්‍රදේශ ලෙස නම් කෙරේ.

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍ය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය, මැදවත්ත හා ඒ අවට ප්‍රදේශ තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. උත්සව භූමිය තුළ වෙළෙඳාම් කිරීම සඳහා වෙන් කරනු ලැබූ බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

* උත්සව කාලය තුළ වෙළෙඳාම් කිරීම සඳහා බදු දෙනු ලබන තාවකාලික කඩබිම් තුළ හා ඒ අවට නීත්‍යානුකූල නොවන භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම, විකිණීම සපුරා තහනම් ය,
* ඩෙංගු මර්ධනය සඳහා සියළු තාවකාලික කඩ හිමියන් විසින් ඉවත දමනු ලබන අපද්‍රව්‍ය ස්ථානගත කර ඇති බඳුන්වලට පමණක් බැහැර කළ යුතු ය.

5. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටි පන්දම් හා භාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම් ය.

6. විනෝද ක්‍රීඩා වෙනුවෙන් පැනවෙන නීති හා මෙම සියලු නීති කටයුතු සඳහා බස්නායක නිළමේතුමාගෙන් අවසර ලබා ගත යුතු අතර, ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලා සිටිනු ලබන බද්ද ක්‍රීඩාව පවත්වාගෙන යනු ලබන අය විසින් ගෙවිය යුතු ය. එකී ක්‍රීඩා සඳහා විකාශන යන්ත්‍ර භාවිතා කරන්නේ නම් ගරු අධිකරණයේ අවසර ලබාගත යුතු අතර, මහ පෙරහැරේ වීදි බැසීමත් සමග සියලු කටයුතු තාවකාලිකව නතර කළ යුතු ය. පෙරහැර අවසන් වූ පසු අවශ්‍ය නම් එම කටයුතු පැවැත්විය හැකි ය.

7. ඉහත අංක 04, 06 වගන්තිවලින් නියම කර ඇති භූමිය තුළ හැර වෙනත් කිසිම ස්ථානයක වෙළෙඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

8. දේවාල භූමියේ හා උඩ මළුවේ බීමතින් හැසිරීම, දුම්වැටි භාවිතා කිරීම, සපුරා තහනම් ය.

9. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර, සතුනට ආහාර සැපයීම නොකළ යුතු ය.

10 උත්සව භූමියට වාහන ඇතුළු කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ඇති වාහන වලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ගවල වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ :

* කොළඹ-බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අළුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හංදියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය,
* තොටපල්ල, පොකුණේගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය,
* පිරිත්වත්ත, ගල්වත්ත ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.

11. දේවාල භූමියට පිවිසෙන අවසරලත් වාහන ගාල් කර තැබීම සඳහා පහසුකම් පාසල් ක්‍රීඩා පිටියේ සළසා ඇත.

12. දේවාලයේ දික් ගෙය, මාලිගාවේ ඉහළ මාලය, ඡායාරූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

09 - 222

---

## ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - හඟුරන්කෙත

### හඟුරන්කෙත විෂ්ණු දේවාල පෙරහැර

සියලු දෙනාගේ දැනගැනීම පිණිසයි

රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ (2) වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් හඟුරන්කෙත ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2016 වර්ෂයට අදාළව හඟුරන්කෙත විෂ්ණු දේවාල පෙරහැර 2016.09.01 වැනි දින සිට 2016.09.17 වැනි දින දක්වා පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

අමිල නවරත්න,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2016 අගෝස්තු මස 15 වැනි දින,

09-223

CUL/STEYU/03/12/2015

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - එරාවුර්පත්තු, වෙංකලඩි**

වන්දනා ගමන් ආඥාපනත

**සිත්තාන්ඩි ශ්‍රී චිත්‍රවේලායුධ ස්වාමි කෝවිල් උත්සවය -2016**

යථෝක්ත උත්සවය 2016 සැප්තැම්බර් 01 වැනි දින පටන් ගෙන 2016 සැප්තැම්බර් 16 වැනි දින දක්වා පවත්වන බව මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1984.07.16 වැනි දින අංක 9866 දරන ආණ්ඩුවේ *ගැසට්* නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරමි.

ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
එරාවුර් පත්තු,
වෙංකලඩි.

2016 අගෝස්තු මස 22 වැනි දින,
වෙංකලඩි, එරාවුර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 455

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/05/2016/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.09.09 වැනි දින සිට 2016.09.23 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.09.30 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කෑඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| හලාවත දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී කොට්ඨාසයේ 141 වෙළුමේ 296 පත්‍රිරුව. | වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, පිටගාරේ පිහිටි "ලුණුම්දෙල්ලගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඩී. ජේම්ස් මහතා විසින් 1960.04.09 වැනි දින මැන සාදන ලද අංක 731 දරන පිඹුරේ ලොට් සී සඳහා මායිම්,<br><br>*උතුරට* : 731 සිතියමේ ලොට් බී දරන මෙම කොටස ද,<br>*නැගෙනහිරට* : අංක 123797 සහ 1237259 දරන සිතියම්වල සඳහන් දූනට අයි. ආර්. ප්‍රනාන්දුපුල්ලේට අයිති ඉඩම,<br>*දකුණට* : එකී 731 සිතියමේ එෆ් අක්ෂරය දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ද,<br>*බස්නාහිරට* : එකී 731 සිතියමේ ඩී අක්ෂරය දරන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාරකට ඇර තිබෙන අඩි අටක් පළලින් යුත් එම සිතියමේ ජී අක්ෂරය දරන කොටස.<br><br>ප්‍රමාණය : අ. 01, රූ. 0, පර්. 0. | 01. එම්. එෆ්. ඩබ්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1960.04.30 වැනි දින අංක 125 දරන විකුණුම්කරය.<br><br>02. එච්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1961.08.22 වැනි දින අංක 710 දරන බදුකරය.<br><br>03. එච්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1965.12.07 වැනි දින අංක 1870 දරන බදුකරය.<br><br>04. ඒ. එම්. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1975.03.02 වැනි දින අංක 461 දරන බදුකරය.<br><br>05. එච්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1976.07.15 වැනි දින අංක 3525 දරන විකුණුම්කරය. |

09 - 252

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි අංක PB676 PQ දරන, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 ජූලි මස 27 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, පිළියන්දල, පරණ පාරේ, අංක 77 දරන ස්ථානයේ පදිංචි ෂෙහාන් දමිත හපුතන්ත්‍රි (ජා.හැ.අ. 740300016V හිමි) යන අය (මෙහි මින්මතු ඇතැම් තැනක බන්ධනදායී වශයෙන් හඳුන්වනු ලබන,) විසින් රුපියල් හතළිස්ලක්ෂයක (රු. 4,000,000) වාර ණයක් සහ රුපියල් විසිලක්ෂයක (රු. 2,000,000) අයිරා පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, ඉහත කී බන්ධනාදායී විසින් රුපියල් හැටලක්ෂයක (රු. 6,000,000) මුදලක් සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්.එස්.සී. පීරිස් විසින් සහතික කරන ලද අංක 172 සහ 2014.01.03 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් හැටලක්ෂයක (රු. 6,000,000) මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2015.10.28 වන දිනට මුළු හිඟ මුදල වන රුපියල් පනස්හයලක්ෂ හතළිස් දෙදහස් තුන්සිය අනූ දෙකකුත් ශත අටක (රු. 5,642,392.08) මුදල සහ ඒ මත 2015.10.29 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් පොලිය ද, එකී බන්ධනදායීගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් යම් කවර ම වූ කොටසක් එකී බන්ධනාදායී විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර

ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් මූල්‍ය පහසුකම් මත මුළු හිඟ මුදල වන රුපියල් පනස්හයලක්ෂ හතළිස් දෙදහස් තුන්සිය අනූ දෙකකුත් ශත අටක (රු. 5,642,392.08) මුදල සහ ඒ මත 2015.10.29 වැනි දින සිට පොළිය ද, තව ද, ඉහත කී අංක 172 දරන උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 172 සහ 2014.01.03 වැනි දින දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව මහනගර සභා සීමාව තුළ පිළියන්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාම්පේ ග්‍රාම නිලධාරි වසම තුළ මාම්පේ පිහිටි මහරගම පාරේ වරිපනම් අංක 610 දරන කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 2491 සහ 2012 අප්‍රේල් මස 10 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 2 දරන බිම් කොටසට මායිම් : උතුරට : මහරගම පාර ද, නැගෙනහිරට : එම පිඹුරේ කැබලි අංක 1 ද, දකුණට : එම පිඹුරේ කැබලි අංක 1 ද, බස්නාහිරට : ඒ.ඒ. මාතියෙස් පෙරේරා යන අයගේ දේපළ ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2491 දරන පිඹුර අනුව රූඩ් එකක් (අ. 0, රූ. 01, පර්. 0) *හෙවත්* හෙක්ටයාර 0.1012 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලුදේත් සමඟ ය. මෙම දේපළ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C314/130 දරන වෙළුමේ/පත් ඉරුවේ යථා පරිදි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්.ඩී.එන්.එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-326

---

### මහජන බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.07.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් මහත්මිය විසින් 2016.02.17, 2016.02.17, 2016.02.17 හා 2014.02.10 දිනයන්හි ලියා සහතික කරන ලද පිළිවෙලින් අංක 9185, 9187, 9189 සහ 5611 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, හෙට්ටි ආරච්චිගේ ධනුෂ්ක ප්‍රභාත් පෙරේරා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ රුපියල් හැටතුන් ලක්ෂ හැට දහස් නවසිය හැට හතර (රු. 6,360,964) ක මුදලක් රුපියල් තිස් දෙලක්ෂය (රු. 3,200,000) ක මුදලක් රුපියල් පහළොස් ලක්ෂය (රු. 1,500,000) ක මුදලක් රුපියල් තිස් ලක්ෂය (රු. 3,000,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද 2016.03.19 දින සිට වර්ෂයකට 14% බැගින් රුපියල් හැටතුන් ලක්ෂ හැට දහස් නවසිය හැට හතර (රු. 6,360,964) ක මුදලක් සඳහා සහ 2016.02.24 දින සිට වර්ෂයකට 15% බැගින් රුපියල් තිස් දෙලක්ෂය (රු. 3,200,000) ක මුදලක් සඳහාද 2016.02.19 දින සිට වර්ෂයකට 15.5% බැගින් රුපියල් පහළොස් ලක්ෂය (රු. 1,500,000) ක මුදලක් සඳහාද 2016.02.19 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් තිස් ලක්ෂය (රු. 3,000,000) ක මුදලක් සඳහාද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හැටතුන් ලක්ෂ හැට දහස් නවසිය හැට හතර (රු. 6,360,964) ක මුදල, රුපියල් තිස් දෙලක්ෂය (රු.3,200,000) ක මුදල, රුපියල් පහළොස් ලක්ෂය (රු. 1,500,000) ක මුදල සහ රුපියල් තිස් ලක්ෂය (රු. 3,000,000) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංකඃ 9185, අංක 9187, අංක 9189 සහ අංක 5611 දරන උකස්කරයන් යටතේ බැංකුවට උකස් කර මෙහි පහත පලවන පළමු හා දෙවන උපලේඛනයේ සඳහන් කර ඇති එකී දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක : 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කොරළයේ, අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකොළ උතුර ග්‍රාම නිළධාරි වසමේ බියගම ප්‍රාදේශීය සභා සීමාවේ මාකොළ උතුර ග්‍රාමයේ පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මානක එල්. එන්. ප්‍රනාන්දු මහතා විසින් 2012.02.01 වැනි දින මැන සාදන ලද අංක 5354 දරන පිඹුරේ ලොට් 05 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 8 (අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කළ) ද, නැගෙනහිරට : ලොට් අංක 6 සහ 7 ද, දකුණට : පඤ්ඤාසිරි මාවත ද, බස්නාහිරට : පඤ්ඤාසිරි මාවත ද යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදි සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 304/77 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කොරළයේ, අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකොළ උතුර ග්‍රාම නිළධාරි වසමේ බියගම ප්‍රාදේශීය සභා සීමාවේ මාකොළ උතුර ග්‍රාමයේ පිහිටි ජම්බුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. එන්. ප්‍රනාන්දු මහතා විසින් 2007.01.30 වැනි දින මැන සාදන ලද අංක 3369 දරන පිඹුරේ ලොට් X දරන කොටසට මායිම්, උතුරු නැගෙනහිරට :- පිඹුරු අංක 52/95 සඳහන් ලොට් අංක 3 ද, දකුණු නැගෙනහිරට :- පිඹුරු අංක 52/95 සඳහන් ලොට් අංක 2 ද, දකුණු බස්නාහිරට :- ඒ. ඩබ්. ඇලිස් නෝනාට අයත් ඉඩම ද, උතුරු බස්නාහිරට :- ශ්‍රී. පඤ්ඤාසිරි මාවත ද යන මායිම් තුල පිහිටි පර්චස් විසි තුනයි දශම එකයි පහ (අ. 0, රූ. 0, පර්. 23.15) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක N 304/78 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

09 - 428

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ඩී. එම්. පී. දිසානායක.
ගිණුම් අංක : 0074 5000 3632.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015 නොවැම්බර් මස 26 වැනි දින පවත්වන්නට යෙදුණ රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බඳුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳවල යන අය විසින් ලියා සහතික කරන ලද 2013 දෙසැම්බර් මස 05 දතම හා අංක 640 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දිසානායක මුදියන්සේලාගේ පියතිලක දිසානායක යන අය බන්ධනදයින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 640 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ හය ලක්ෂ තිස් හය දහස් හයසිය හැට දෙකයි ශත එකොළහක (රු. 76,36,662.11) මුදලක් 2015 නොවැම්බර් මස 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ හය ලක්ෂ තිස් හය දහස් හයසිය හැට දෙකයි ශත එකොළහක (රු. 76,36,662.11) මුදලද, 2015 නොවැම්බර් මස 06 වැනි දින සිට අංක 640 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් ලක්ෂ හැට හය දහස් දෙසීයයක (රු. 30,66,200.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම හතයි පහක් (17.75%) හා තවත් රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළියද, දූන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා , අංක 640 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ දඹගල්ල කෝරළේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දඹගල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇල්පිටිය ග්‍රාමයේ පිහිටි '' ගල්ලිඳවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. ජී. සී. පුෂ්පකුමාර යන අය විසින් සාදන ලද 2009 නොවැම්බර් මස 05 දතම හා අංක 4785 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් , උතුරට : කන්ද, නැගෙනහිරට : ලොට් 2, දකුණට : පාර (H) සහ බස්නාහිරට - එච්. එම්. ජයතිස්ස යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකොළහයි දශම හයක් (A. 0, R. 1, P. 11.6) හෝ හෙක්ටයාර 0.1305 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ මාර්ග අයිතීන් ද, වෙනත් අයිතින් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන්

සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක 4785 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව H 04/83 යටතේ මොනරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් සහ උපබෙදුමකි.

එකී ඇල්පිටිය ග්‍රාමයේ පිහිටි '' ගල්ලිඳවත්ත'' යයි කියනු ලබන ඉඩමට අංක V P 640 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදවෙන්කොට ලොට් 81 (කොටසක්) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. එම්. කිරිබණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ගල්ලිඳආර, දකුණට : පාර (PWD) සහ බස්නාහිරට : හුලංනුගේ වත්තේ පැළ ඉණි වැට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුනක් (3A., 0 R., 0 P. ) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක VP 640 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09 - 436/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

සෙල්ලම් ෆිල්ම් ඉම්පෝටර්ස්.
ගිණුම් අංක 0107 1000 0129.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016 ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුණ රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. කනගරත්නම් යන අය විසින් ලියා සහතික කරන ලද 2014 නොවැම්බර් මස 26 දතම හා අංක 8038 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ''සෙල්ලම් ෆිල්ම් ඉම්පෝටර්ස් '' යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන කනපතිපිල්ලෙයි මොහාන් යන අය බන්ධනදයීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 8038 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තිස්තුන් ලක්ෂ අසූතුන් දහස් එකසිය හැත්තෑ තුනයි ශත හැට හතක් (රු. 33,83,173.67) මුදලක් 2016 ජනවාරි මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්තුන් ලක්ෂ අසූතුන් දහස් එකසිය හැත්තෑ තුනයි ශත හැට හතක් (රු. 33,83,173.67) මුදල , 2016 ජනවාරි මස 19 වැනි දින සිට අංක 8038 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10 %) හා තවත් රුපියල් තුන් ලක්ෂ පනස් දහසක (රු. 350,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10 %) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුව ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා , අංක 8038 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**පළමු උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තුවේ, චෙන්කලාඩි (පුත්තූර්) ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන එස්. එස්. සෙල්වරත්නම් යන අය විසින් සාදන ලද 1971 ඔක්තෝම්බර් මස 01 දතම හා අංක 265 දරන පිඹුරේ නිරූපිත වෙලින්ටන් තියටර් වශයෙන් වර්තමානයේ හඳුන්වනු ලබන '' කිඩ්ඩන්කි වලව්'' යයි කියනු ලබන ඉඩම් කොටසට මායිම්, ඊසානට : පන්චචාරම්ගේ ඉඩම, ගිණිකොනට : උතුරු මායිම් පාර, නිරිතට : PWD ප්‍රධාන පාර සහ වයඹට : ශාන්ති හෝටල් පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි තුනක් (A. 0, R. 1, P. 23) බලයලත් මානක තැන ඒ. සින්ගරාජා යන අය විසින් සාදන ලද 2005 මැයි මස 20 දතම හා අංක AS 2005/897 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) විශාල ඉඩම් කොටස සමග සියළුම අයිතීන්, මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග වෙළුම/පත්‍රිරුව A 121/05, A 121/201, A 121/205, A 121/ 207 සහ C 0030/43 යටතේ ලියාපදිංචි කොට ඇත.

**දෙවන උපලේඛනය**

එකී චෙන්කලාඩි (පුත්තූර්) ග්‍රාමයේ පිහිටි '' කිඩ්ඩන්කි වලව්'' *නොහොත්* වෙලින්ටන් තියටර් යයි කියනු ලබන ඉඩම් කොටසේ උතුරු කොටසට මායිම්, උතුරට සහ දකුණට - කනපතිපිල්ලෙයි මොහාන්ගේ ඉතිරි ඉඩම් කොටස නැගෙනහිරට - මායිම් පාර සහ බස්නාහිරට - කනපතිපිල්ලෙයි මොහාන්ගේ ඉතිරි ඉඩම් කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් නැගෙනහිර සිට බස්නාහිරට අඩි 30 සහ උතුර සිට දකුණට අඩි 20 සමග සියළුම අයිතීන්, මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග

වෙළුම/පත්ඉරුව C 0012/91 යටතේ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෙහි පළමු උපලේඛනයේ විස්තර කොට ඇති ඉතිරි ඉඩම් කොටස සහ දෙවෙනි උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩමේ ඉතිරි කොටස ඒකාබද්ධ කොට ඇති අතර බලයලත් මානක තැන කේ. කමලනාදන් යන අය විසින් සාදන ලද 2014 නොවැම්බර් මස 05 දතම හා අංක KK/BT/2014/1231 හි දක්වා ඇති අතර එය පහතින් විස්තර වේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එරාවූර් පත්තුවේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ චෙන්කලාඩි ග්‍රාමයේ ත්‍රිකුණාමල පාරේ පිහිටි බලයලත් මානක තැන කේ. කමලනාදන් යන අය විසින් සාදන ලද 2014 නොවැම්බර් මස 05 දතම හා අංක KK/BT/2014/1231 හී පිඹුරේ නිරූපිත (බලයලත් මානක තැන ඒ. සින්ගරාජා යන අය විසින් සාදන ලද 2005 මැයි මස 20 දතම හා අංක AS/ 11/2005/897 දරන පිඹුරේ ලොට් 01 හි නැවත මිනුමක් වන මා විසින් පිළියෙල කරන ලද 2012 ඔක්තෝම්බර් මස 10 දතම හා අංක KK/BT/2012/0911 දරන පිඹුරේ ලොට් 01 හි නැවත මිනුමක් ) '' කිඩ්ඩන්කි වලව්'' යයි කියනු ලබන ඉඩම් කොටසට මායිම් , උතුරට : ශාන්ති හෝටල් පරිශ්‍රයන්, නැගෙනහිරට : වර්තමානයේ පන්චඩ්චාරම් යන අය විසින් හිමිකම් කියන වත්ත, දකුණට : මායිම් පාර සහ බස්නාහිරට : ත්‍රිකුණාමල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1490 ක් හෝ රූඩ් එකයි පර්චස් දහ අටයි දශම නමයයි දෙකක් (අ. 0, රූ. 1, පර්. 18.92) විශාල ඉඩම් කොටස සමග එහි අඩංගු ගොඩනැගිල්ල සහ සියළුම අයිතීන් ය. මෙම දේපළ චෙන්කලාඩි G. S. O කොට්ඨාසයේ පිහිටා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09 - 436/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

විෂ්ණු ඉම්පෝර්ට්ස්.
ගිණුම් අංක 00421000 5310.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එම්. එන්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2010 මාර්තු මස 22 දතම හා අංක 451 දරන හා අංක ආර්. ඩී. ජී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2012 ජූලි මස 19 දතම හා අංක 3515 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ '' විෂ්ණු ඉම්පෝර්ට්ස් '' යන ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන් වන සුප්පයියා තිරුණාවුකරසු සහ පිට්චායිපිල්ලෙයි නාගේන්ද්‍රන් යන අය බන්ධනදයින් වශයෙන් හා එකී සුප්පයියා තිරුණාවුකරසු යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 451 සහ 3515 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ හය ලක්ෂ විසිඑක් දහස් හත්සිය හතලිස් හයයි ශත හැත්තෑ හතරක (රු. 76,21,746.74) මුදලක් 2015 ජුනි මස 22 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ හය ලක්ෂ විසිඑක් දහස් හත්සිය හතලිස් හයයි ශත හැත්තෑ හතරක (රු. 76,21,746.74) මුදල ද, 2015 ජුනි මස 23 වැනි දින සිට අංක 451 සහ 3515 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 73,75,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10 %) හා තවත් රුපියල් එක් ලක්ෂ අසූ තුන් දහසක (රු. 183,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10 %) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 451 සහ 3515 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියා යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවන් තුළ කොටහේන බටහිර වෝඩ් අංක 8 පිකරින් පාරේ පිහිටි ආලින්දය, කෑම කාමරය, නිදන කාමර 3, පැන්ට්‍රිය, වැසිකිළි 3, ජල ගබඩාව සහ බැල්කනිවලින් සමන්විත පිකරින්ස් පාර වරිපනම් අංක 194 - 4/2 දරන මහල් නිවාස සංකීර්ණ දේපළින් කොටසක් වන එම්. සී. එල්. සී. පෙරේරා යන අය විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 16 දතම හා අංක 14/99 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට සහධිපත්‍ය ඒකක FH 1 (සිව්වෙනි මහළ) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් දේපළට මායිම්, උතුරට : මෙම ඒකකයේ සහ CE 9 සහ FH 4 ඒකකයේ විවෘත අවකාශය අතර බිත්තියේ මැද, නැගෙනහිරට : මෙම ඒකකයේ සහ CE 25 සහ FH 2 ඒකකය අතර බිත්තියේ

මැද, දකුණට : මෙම ඒකකයේ සහ CE 13 ඒකකයේ විවෘත අවකාශය අතර බිත්තියේ මැද, බස්නාහිරට : එසකිමුත්තු පෙදෙස, වරිපනම් අංක 9, 11, 15, 17 , 9, 21 , 23, 29, 31, 33, 35, 37 සහ 39 දරන පරිශ්‍රයන් සමග මෙම ඒකකයේ බිත්තිය, NADIR (Bottom) නිරීක්ෂකයාගේ හිසට විරුද්ධ දිශාව (පා පස) පත්ල TD1 ඒකකයට ඉහළින් මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මැද, ZENITH (Top) මුදුන (හිස්) ඉහත ඒකක අංක FH 1 හි කොන්ක්‍රීට් පොළොවේ මැද, වර්ග මීටර 79.89 කින් *නොහොත්* වර්ග අඩි 860 ක බිම් ප්‍රදේශයකින් සමන්විතය, ආලින්දය, කෑම කාමරය, නිදන කාමර 3, පැන්ට්‍රිය, වැසිකිළි 3, ජල ගබඩාව සහ බැල්කනි FH 1 ඒකකයේ පිහිටා ඇත, මහල් නිවාස සංකීර්ණ දේපලේ පොදු මූලිකාංගයන්හි FH 1 ඒකකය සඳහා නොබෙදූ කොටස් අගය 2.80% කි, FH 1 ඒකකයට සමීපතම පොදු ප්‍රදේශ පිවිසුම CE 25 වේ.Con A 66/84 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### පොදු මූලිකාංග

ව්‍යවස්ථානුකූල පොදු මූලිකාංග

විස්තර කොට ඇති පොදු මූලිකාංග

1. මහල් නිවාස සංකීර්ණ දේපලේ ව්‍යවස්ථානුකූල පොදු මූලිකාංග, 2003 අංක 39 දරන එපා(ර්)ට්මන්ට් හිමිකාරත්වය (සංශෝධිත) පනතින් සහ 1982 අංක 45 දරන (සංශෝධිත) පනතේ 12 වෙනි වගන්තියෙන් සංශෝධිත 1973 අංක 11 දරන එපා(ර්)ට්මන්ට් නිවාස හිමිකාරත්ව නීතියේ 26 වැනි වගන්තිය මගින් සලසා ඇති පරිදි වේ :

(*අ*) මහල් නිවාස සංකීර්ණ දේපළට අයත් විවෘත අවකාශයන් ද ඇතුළුව ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම,

(*ආ*) ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කුළුනු, බාල්ක (ගර්ඩර්), යටලී (බාල්ක), ආධාරක, ප්‍රධාන බිත්ති සහ වහලය.

(*ඇ*) විදුලිය, දුරකථන, ගුවන්විදුලි, නැවත ව්‍යාප්ත කිරීම්, රූපවාහිනී, ජල පයිප්ප, ජල ටැංකි, ජල ළිඳ (සම්පය), ඉහළින් පිහිටි ජල ටැංකි, පොම්පාගාරය, නළ මාර්ග, මළාපවහන මාර්ගය, ආවරණය කළ විවර (මෑන් හෝල්) සහ කුණු කසල බැහැරකිරීම් වැනි මධ්‍යම සේවාවන් සඳහා ස්ථාපිත කිරීම්.

(*ඈ*) එහි පැවැත්මට, නඩත්තුවට, ආරක්ෂාවට හෝ සාමාන්‍ය පොදු භාවිතයට හෝ අවශ්‍ය හෝ පහසුවක් වන හෝ මෙම දේපළෙහි සියළුම වෙනත් කොටස් සහ පහසුකම්.

මහල් නිවාස සංකීර්ණ ගිවිසුම් ප්‍රකාශයේ පිඹුරෙහි පිටු අංක 43 සිට 47 හි දක්වා ඇති ප්‍රදේශ පොදු මූලිකාංගයන් හි නිර්වචනය සහ විග්‍රහය :

CE 1 (අ) මෙය, ඉඩම සහ බටහිර මායිම දිගේ, පිටුපස විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පිවිසුමක් වශයෙන් පොදු භාවිතය සඳහා වේ.

CE 2 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 3 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 4 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 5 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 6 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 7 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 8 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකකය GD 3 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු ප්‍රදේශය වේ.

CE 9 (අ) මෙය, ඉඩම සහ හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකකය GD 1 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු ප්‍රදේශය වේ.

CE 10 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක සඳහා පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකකය GD 1, ඒකක GD 2, සහ ඒකක GD 3, වෙත පිවිසීමට ඇති සමීපතම පොදු ප්‍රදේශය වේ.

CE 11 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම GD 2, සහ ඒකක GD 3 පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකක GD 2 සහ ඒකක GD 3, වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 12 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම ඒකක GD 2 හි පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකක GD 2 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 13 (අ) මෙය, ඉඩම සහ විවෘත හිස් අවකාශය වේ.
(ආ) හිස් අවකාශය වාතාශ්‍රය සඳහා වේ.
(ඇ) මෙම ඉඩම සියළුම ඒකක වල පොදු භාවිතය සඳහා වේ.
(ඈ) මෙය ඒකක GD 1 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 14 (අ) මෙය, සියළුම මහල් සඳහා සේවා සපයන තරප්පු පෙල සහ සෝපානය වේ.
(ආ) මෙය, සියළුම ඒකක වල පොදු භාවිතය සඳහා වේ.

CE 15 (අ) මෙය, සියළුම මහල් සඳහා සේවා සපයන තරප්පු පෙල සහ සෝපානය වේ.
(ආ) මෙය, සියළුම ඒකක වල පොදු භාවිතය සඳහා වේ.

CE 16 (අ) මෙය, බිම් මහලේ ආවරණය කළ ප්‍රදේශයකි.
(ආ) මෙය, සියළුම ඒකක වලට පිවිසුමක්, වාහන පැදවීමේ මංතීරුවක් සහ වාහන නවතා තැබීමේ පෙදෙසක් වශයෙන් පොදු භාවිතය සඳහා වේ.

CE 17 (අ) මෙය, බිම් මහලේ ආවරණය කළ ප්‍රදේශයකි.
(ආ) මෙය, සියළුම ඒකක වලට පිවිසුමක්, වාහන පැදවීමේ මංතීරුවක් සහ වාහන නවතා තැබීමේ පෙදෙසක් වශයෙන් පොදු භාවිතය සඳහා වේ.

CE 18 (අ) මෙය, පළමු මහලේ ආවරණය කළ ප්‍රදේශයකි.
(ආ) මෙය, ඒකක FT 7 සහ ඒකක FT 8 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක ඒකක FT 7 සහ ඒකක FT 8 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 19 (අ) මෙය, පළමු මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක FT 1, ඒකක FT 2, ඒකක FT 3, ඒකක FT 4, ඒකක FT 5 සහ ඒකක FT 6 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක FT 1, ඒකක FT 2, ඒකක FT 3, ඒකක FT 4, ඒකක FT 5 සහ ඒකක FT 6 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 20 (අ) මෙය, දෙවන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක SD 7 සහ ඒකක SD 8 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක SD 7 සහ ඒකක SD 8 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 21 (අ) මෙය, දෙවන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය මෙය, ඒකක SD 1, ඒකක SD 2, ඒකක SD 3, ඒකක SD 4, ඒකක SD 5 සහ ඒකක SD 6 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක SD 1, ඒකක SD 2, ඒකක SD 3, ඒකක SD 4, ඒකක SD 5 සහ ඒකක SD 6 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 22 (අ) මෙය, තෙවන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක TD 7 සහ ඒකක TD 8 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක TD 7 සහ ඒකක TD 8 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 23 (අ) මෙය, තෙවන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක TD 1, ඒකක TD 2, ඒකක TD 3, ඒකක TD 4, ඒකක TD 5 සහ ඒකක TD 6 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක TD 1, ඒකක TD 2, ඒකක TD 3, ඒකක TD 4, ඒකක TD 5 සහ ඒකක TD 6 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 24 (අ) මෙය, සිව්වන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක FH 7 සහ ඒකක FH 8 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක FH 7 සහ ඒකක FH 8 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 25 (අ) මෙය, සිව්වන මහලේ කොරිඩෝවයි.
(ආ) මෙය, ඒකක FH 1, ඒකක FH 2, ඒකක FH 3, ඒකක FH 4, ඒකක FH 5 සහ ඒකක FH 6 හි පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක FH 1, ඒකක FH 2, ඒකක FH 3, ඒකක FH 4, ඒකක FH 5 සහ ඒකක FH 6 වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

CE 26 (අ) මෙය, ගොඩනැගිල්ල මුදුනේ විවෘත ටෙරසයයි.
(ආ) මෙය පොදු භාවිතය සඳහා වේ.
(ඇ) මෙය, ඒකක FF 1 ඒකක වෙත පිවිසීමට ඇති සමීපතම පොදු පෙදෙස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09- 436/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. එල්. කේ. බෝධිනායක.
ගිණුම් අංක : 0160 5000 2822.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016.07.28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්ද 2012 අප්‍රේල් මස 09 දාතම හා අංක 2375 උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපයට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැදවත්ත ලේකම්ලාගේ කැලුම් බෝධිනායක යන අය බන්ධදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2375 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් ලක්ෂ අනූ තුන් දහස් නමසිය තිස් නමයයි ශත පනස් දෙකක (රු. 5,093,939.52) මුදලක් 2016 ජුනි මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් ලක්ෂ අනූ තුන් දහස් නමසිය තිස් නමයයි ශත පනස් දෙකක් (රු. 5,093,939.52) මුදල ද, 2016 ජුනි මස 28 වැනි දින සිට අංක.

2375 දරන එකී බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් තුන් ලක්ෂ අනූ දෙදහස් දහ හතයි ශත දහ හතරක් (රු. 43,92.017.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 2375 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසි කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ කෑගල්ල සුළු නගර සභා සීමාවන් තුළ ඔලගම පිහිටි ''වකයායේවත්ත සහ දෙල්ගහමුලහේන'' (බලයලත් මානක තැන ටී. එන්. කාදර් යන අය විසින් සාදන ලද 2004 මැයි මස 26 දාතම හා අංක 4066/අ පිඹුරෙහි ලොට් 03 සහ බලයලත් මානක තැන එල්. බි. බැද්දවෙල යන අය විසින් සාදන ලද අංක. 2568/A හි, දිස්ත්‍රික් උසාවි නඩු අංක 18734, ලොට්1, 2, 3, 4, 5, සහ 6හි නැවත මිනුමක් වන) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 30 දාතම හා අංක 876/11 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කෑගල්ල සිට ඔලගම දක්වා දිවෙන පාර, නැගෙනහිරට : වෙදරාලගේ වත්ත, දකුණට : මිරිහෙල්ල හි අරඹ ඉඩම සහ බස්නාහිරට : අංක. 2568/A දරන පිඹුරේ ලොට් 8 මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතයි (අ. 0, රූ. 1, පර්. 37) හෝ හෙක්ටයාර 0.1947 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාද ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී පිඹුරට අනුවය.

එකී ලොට් 2 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී ඔලගම ග්‍රාමයේ පිහිටි ''වකයායේවත්ත සහ දෙල්ගහමුලහේන'' (බලයලත් මානක තැන එල්. බී. බැද්දෙවෙල යන අය විසින් සාදන ලද අංක 2568/A දරන පිඹුරේ ලොට් 1,2,3,4,5 සහ 6 හි නැවත මිනුමක් සහ උප බෙදුමක් වන, කෑගල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක. 18734) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. එන්. කාදර් යන අය විසින් සාදන ලද 2004 මැයි මස 26 දාතම හා අංක. 4066/අ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර, නැගෙනහිරට : වෙදරාලගේ වත්ත සහ ඉලුක්පැලැස්සේ වත්ත, දකුණට : මිරිහල්ල යන අය විසින් හිමිකම් කියනු ලබන අරඹ සහ බස්නාහිරට : නඩු අංක. 18734 යටතේ කෑගල්ල දිස්ත්‍රික් උසාවියේ තැන්පත් කොට ඇති ලේඛනයට අනුව, බලයලත් මානක තැන එල්. බී. බැද්දෙවෙල යන අය විසින් සාදන ලද අංක 2568/A දරන පිඹුරේ නිරූපිත ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතක් (A:0 R:1 P:37) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, සහ එහි පිහිටි සෑම සියළු දේ එකී පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව A 573/90 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09 - 437

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2016.08.04 වෙනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී.වීරසූරිය විසින් සහතික කරන ලද 2012.08.09 දිනැති අංක 1811 දරන උකස් බැඳුම්කරයට අනුව 2016.05.03 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැට හය ලක්ෂ තිස්දෙදහස් එකසිය හැට නවයයි ශත හතරක (රු. 6,632,169.04) මුදල සමඟ රුපියල් හතලිස් නව ලක්ෂ හැට දහස් තුන්සිය හතලිස් එකයි ශත විසිහයක (රු. 4,960,341.26) මුදල මත වසරකට සියයට දහය (10%) බැගින් පොලියක් 2016.05.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කළුතර දකුණ, කලමුල්ල, 1 වන පටුමගෙහි පිලුප්පු මන්දදිගේ නිශාන් ප්‍රගීත් තිසේරා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2012.08.09 දිනැති එකී අංක 1811 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට හය ලක්ෂ තිස්දෙදහස් එකසිය හැට නවයයි ශත හතරක (රු. 6,632,169.04) මුදල සමඟ 2016.05.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව , විහාර මාවතේ , අංක 50/3 හි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ , කළුතර ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ , කළුතර දිස්ත්‍රික්කයේ , කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කළුතර ප්‍රාදේශීය සභා සීමාවෙහි (නාගොඩ උප කාර්යාලය ) කළුතර උතුරු තොටමුනේ , කළුතර බැද්දෙහි අංක 731 / A දරන කලමුල්ල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කලමුල්ල ග්‍රාමයෙහි පිහිටි වරිපනම් අංක 15 / 30 දරන " **ගොරකගහවත්තෙහි** " ලොට් 6 නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. මලිත් මොහාන් ද සිල්වා විසින් සාදන ලද 2007 ජූලි 22 දිනැති අංක 1627 දරන පිඹුරෙහි ලොට් A 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A1, උතුරට : පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 ද, දකුණට : දැනට බී.ඩබ්. ප්‍රනාන්දුට අයිති ඇට්ටිගහවත්ත ද, බස්නාහිරට : පළමුවන පටුමග ද මායිම්ව අංක 1627 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 14.80) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද සමග වේ.

එකී ලොට් A 1 පහත සඳහන් ඉඩහෙමහි නැවත මැනීමකි.

එකී කලමුල්ල ග්‍රාමයෙහි පිහිටි " **ගොරකගහවත්තෙහි** " ලොට් 6 (පිඹුරෙහි කොරකගහවත්තෙහි ලොට් 6 ලෙස වැරදියට සඳහන්) ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 2004 ඔක්තෝබර් 22 දිනැති අංක 4187 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : අඩිපාර ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 5 ද, දකුණට : දැනට බී. ඩබ් . ප්‍රනාන්දුට අයත් ඇට්ටිගහවත්ත ද, බස්නාහිරට : පළමුවන පටුමග ද මායිම්ව එකී අංක 4187 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 15.80) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි , ගහකොළ සහ වෙනත් සියලු දේ ද සමග වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G237 /257 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

යූ. එල් නිමල් ශාන්ත මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
කළුතර අධිශ්‍රේණි ශාඛාව.

09 - 475

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2016.07.15 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2011.09.21 වැනි දිනැති අංක 2245 දරන උකස් බැඳුම්කරය සහ 2006.12.07 වැනි දිනැති අංක 325 දරන උකස් බැඳුම්කරයට අනුව 2016.05.03 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රු. 6,41,61,397.18 (රුපියල් හයකෝටි හතලිස් එක් ලක්ෂ හැට එක් දහස් තුන්සිය අනූහතයි ශත දහඅට) ක මුදල සමග රු. 4,32,45,790.00 (රුපියල් හතරකෝටි තිස්දෙලක්ෂ හතලිස්පන් දහස් හත්සිය අනූව) ක මුදල මත වසරකට සියයට දොළහ (12%) බැගින් පොලියක් 2016.05.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් අලුත්ගම, කලුවාමෝදර, දේවාල පාරේ, වෙඩික්කාර උදර්ම මන්ඩු රාජික්ද සිල්වා මහතා සහ දෙමුනි නාලනි සේපාලිකා ද සිල්වා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2006.12.07 වැනි දිනැති 325 අංක සහ 2011.09.21 වැනි දිනැති එකී අංක 2245 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රු. 6,41,61,397.18(රුපියල් හයකෝටි හතලිස් එක් ලක්ෂ හැට එක් දහස් තුන්සිය අනූහතයි ශත දහඅට) ක මුදල සමග 2016.05.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධානවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අලුත්ගම ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

(1) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවේ, කළුතර දකුණ තොටමුනේ, අලුත්ගම් බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ (මාලේවන්බැද්ද උප කාර්යාලය) අලුත්ගම, අංක 762 C දරන කලුවාමෝදර (නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කලුවාමෝදර පිහිටි '' මහ ඕවිට'' *හෙවත්* '' මහකුඹුර'' නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ හා වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්. පෙරේරා විසින් සාදන ලද 2004 ජූනි මස 18 වැනි දිනැති අංක 2618 දරන පිඹුරෙහි ලොට් 3 A ලෙස දක්වා නිරූපණය කර ඇති බිම් කැබැල්ල එනම් එකී ලොට් 3 A උතුරට : මහගොඩැල්ල *හෙවත්* වතුබොඩඕවිට සහ දේවාල පාර ද, නැගෙනහිරට : දේවාල පාර සහ ගලබැන්දලියද් ද, දකුණට : ගලබැන්දලියද්ද ද සහ වතුබොඩඕවිට ද, බස්නාහිරට : වතුබොඩඕවිට සහ වටුවගෙලියද්ද *හෙවත්* රදුන්ගෙවත්ත ද මායිම්ව අංක 2618 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දොළහයි දශම අටයි තුනක (අ. 0, රූ. 1, පර්. 12.83) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 267/193 හි ලියාපදිංචි කර ඇත.

මෙකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එච්. ජී. ද එස්. තාබෘ විසින් මෑතකදී සාදන ලද 2005 ජූනි මස 20 වැනි දිනැති අංක 1854 දරන පිඹුරට අනුව පහත පරිදි විස්තර කොට ඇත.

එකී කලුවාමෝදර ග්‍රාමයේ පිහිටි ''මහඕවිට'' *හෙවත්* '' මහකුඹුර'' නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ

වෙනත් සියලු දේ ද ඇතුළත් වූ අංක 1854 දරන පිඹුරෙහි ලොට් 3 *A* ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 *A* උතුරට මහගොඩැල්ල හෙවත් වතුබොඩඕවිටද, නැගෙනහිරට දේවාල පාර සහ ගලබැන්දලියැද්ද (දුන් අඩි 10 පළල පාර - ලොට් 3 *B*) ද, දකුණට වතුබොඩඕවිට සහ අඩි 10 පළල පාර ලොට් 3 *B* ද, බස්නාහිරට වතුබොඩඕවිට සහ වටුවගෙලියැද්ද හෙවත් රදුන්ගෙවත්ත ද මායිම්ව අංක 1854 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් එකොළහයි දශම නවයයි පහක (අ. 0, රූ. 1, පර්. 11.95) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

(2) එකී බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවේ කළුතර දකුණ තොටමුනේ, අලුත්ගම් බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ (මාලේවන්බැද්ද උප කාර්යාලය) අලුත්ගම, අංක 762 *C* දරන කලුවාමෝදර (නැගෙනහිර) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කලුවාමෝදර පිහිටි වතුබොඩකුඹුරෙ ලොට් 2 නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. පී. ඩී. එස්. තාබෘ විසින් සාදන ලද 2005 ජනවාරි මස 08 වැනි දිනැති එහෙත් වඩාත් නිවැරදිව 2005 මාර්තු මස 18 වැනි දිනැති අංක 1741 දරන පිඹුරෙහි ලොට් ''*2B1*'' ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් '' *2B1*'' උතුරට : ගාලු පාරේ සිට සීලානන්ද පාර දක්වා පාර ද, නැගෙනහිරට : ලොට් '' *2B2*'' සහ දෙනියගෙඕවිට හෙවත් මහකුඹුර ද, දකුණට : වත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් *2 C* සහ ලොට් 1 (අඩි 10 පළල පාරට අනුව) සහ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥපනතේ ලොට් *2A* ද මායිම්ව එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් තිස්හතක (අ. 0, රූ. 0, පර්. 37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ *H277/17* හි ලියාපදිංචි කර ඇත.

(3) එකී බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවේ කළුතර දකුණ තොටමුනේ, අලුත්ගම් බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ (මාලේවන්බැද්ද උප කාර්යාලය) අලුත්ගම, අංක 762 *C* දරන කලුවාමෝදර (නැගෙනහිර) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කලුවාමෝදර පිහිටි ''වතුබොඩකුඹුරෙහි'' ලොට් 2 නැමති ඉඩමෙහි එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත් වූ අංක 1741 දරන පිඹුරෙහි ලොට් '' 2B3'' ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් '' 2B3'' උතුරට : ලොට් 2B1 ද, නැගෙනහිරට : දෙනියගෙඕවිට හෙවත් මහකුඹුර ද, දකුණට : වත්තහේවගේ ලියද්ද *හෙවත්* කොම්බුවපිටිය සහ බත්හැලිය (ලොට් 2B1 ලෙස ලියාපදිංචිව ඇත.) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 2B1 ද මායිම්ව එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම තුනයි දෙකක (අ. 0, රූ. 0, පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H277/18 හි ලියාපදිංචි කර ඇත.

(4)මේ සමඟ මෙයට එකී අංක 1741 දරන පිඹුරෙහි ලොට් 2C ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් පාරේ අයිතියද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඒ. එන්. ප්‍රනාන්දු මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අලුත්ගම.

09 - 476

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.